සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii) සහ (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රයක් වන දීපවංශය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
    (1) ඓතිහාසික පුවත් දීර්ඝ ලෙස දක්වා තිබීම.
    (2) ක්‍රි.ව. 5 වන සියවසේ දී ලියා තිබීම.
    (3) දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතුරින් පැරණිම වංශකථාව වීම.
    (4) රටේ ආර්ථිකය පිළිබඳව තොරතුරු ඇතුලත් වීම.

02. මහා වංශයේ මුල් කොටස රචනා වී ඇත්තේ කුමන කාල වකවානුවේ ද?
    (1) ක්‍රි.ව. 4 වන හෝ 5 වන සියවස්වල. (2) ක්‍රි.ව. 5 වන හෝ 6 වන සියවස්වල.
    (3) ක්‍රි.ව. 6 වන හෝ 7 වන සියවස්වල. (4) ක්‍රි.ව. 7 වන හෝ 8 වන සියවස්වල.

03. සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, හටන් කාව්‍ය වලින් තොරතුරු ලබාගත හැක්කේ කුමන යුග පිළිබඳව ද?
    (1) කෝට්ටේ හා මහනුවර යුගය තෙක්
    (2) ගම්පොළ සමය සිට කෝට්ටේ සමය තෙක්
    (3) දඹදෙනි සමයේ සිට කුරුණෑගල සමය තෙක්
    (4) අනුරාධපුර සමය සිට පොළොන්නරුව සමය තෙක්

04. රටේ ආර්ථික තත්වය, වෙළඳාම, ලෝහ භාවිතය පිළිබඳව තොරතුරු දැනගැනීමට හැකි සුදුසුම මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?
    (1) සෙල්ලිපි (2) වංශකතා (3) නටඹුන් (4) කාසි

05. පහත සඳහන් මූලාශ්‍රයන් අතුරින් චීන දේශාටන භික්ෂූන් වහන්සේ නමක් වන පාහියන් හිමිගේ දේශාටන වාර්තාව වන්නේ,
    (1) එදා හෙළදිව (2) බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය
    (3) නැචුරාලිස් හිස්ටෝරියා (4) වංසත්ථප්පකාසිනි

06. විවිධ පරිසර කලාප තුල ජීවත් වූ ගල් යුගයේ වැසියන්ගේ ආහාර පාරිභෝජනයේ හා තාක්ෂණයේ විවිධතා ඇතිවූයේ කුමන කරුණක් නිසාද?
    (1) වර්ෂාපතනයේ සිදු වූ වෙනස්කම් නිසා (2) උෂ්ණත්වයේ සිදු වූ වෙනස්කම් නිසා
    (3) සුළගේ ඇති වූ බලපෑම් නිසා (4) පසෙහි සිදු වූ වෙනස්කම් නිසා

07. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ වෙරළාසන්න එළිමහන් වාසස්ථානයක් හා කඳුකර එළිමහන් දඩයම් වාසස්ථානයක් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ මින් කුමක් ද?
    (1) බෙල්ලන්බැඳිපැලැස්ස හා සීගිරියේ පොතාන (2) පාහියන්ගල හා හෝර්ටන්තැන්න
    (3) බූන්දල හා බණ්ඩාරවෙල (4) කිතුල්ගල බෙලිලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස

08. ලංකාවේ ගල්යුගයේ විසූ මිනිසුන් හා වර්තමාන වැදි ජනතාව අතර පවතින සමානතාවයන් ලෙස පර්යේෂකයින් පෙන්වා දී ඇති ක්ෂේත්‍ර මොනවාද?
    (1) සංස්කෘතික හා දේශපාලන වශයෙන් (2) සංස්කෘතික හා ජීව විද්‍යාත්මක වශයෙන්
    (3) ආර්ථික හා දේශපාලන වශයෙන් (4) සංස්කෘතික හා ආර්ථික වශයෙන්

09. නිවාස ඉදිකිරීමේදී ගිලා නොබසින ලෙස ගෙබිම සකස් කර ගැනීමත් පොළොවට ලම්බාකාර ලෙස බිත්ති ඉදිකිරීමත් යන තාක්ෂණික උපක්‍රම භාවිතා කළේ කුමන යුගයේ වැසියන් ද?
    (1) දඩයම් යුගයේ (2) පූර්ව ඓතිහාසික යුගයේ
    (3) මුල් ඓතිහාසික යුගයේ (4) ප්‍රාග් ඓතිහාසික යුගයේ

10. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල පරිපාලන ක්‍රම වලට අදාලව ගම්වල ගැටළු විසඳූ කණ්ඩායම කළුදිය පොකුණ සෙල්ලිපියේ අනුව හඳුන්වා ඇත්තේ කෙසේ ද?
(1) ගෘහපතීන් ලෙස (2) ගමික ලෙස (3) දසගම්ඇත්තන් ලෙස (4) පරුමකවරු ලෙස

11. පරුමකවරු ශ්‍රී ලංකාවේ දේශපාලන බල විකාශනයේ දී වැදගත් පිරිසක් ලෙස සලකනු ලබන්නේ ඇයි?
(1) වැව් පද්ධතිය හා ඊට අදාල ගම් කිහිපයක වැසියන්ගේ සුභ සිද්ධිය සොයා බැලීම නිසා.
(2) ගම් කීපයක දේශපාලන කටයුතු පිළිබඳව තීරණ ගත් නිසා.
(3) ගම් කීපයක සංස්කෘතික කටයුතු පිළිබඳව සොයා බැලූ නිසා.
(4) ගම් කීපයක අධිකරණ කටයුතු පිළිබඳව සොයා බැලීම නිසා.

12. රටේ දේශපාලන බලය මධ්‍යගත වූ පසු රටේ පාලකයා හැඳින්වීමට යෙදූ නම කුමක් ද?
(1) මහා පරුමක (2) රජ (3) මහරජ (4) ග්‍රාමණී

13. පරිපාලනයේදී ජනතාවගේ සුභසිද්ධිය සැලසීම අතීත රජවරුන් අතින් සිදු වූ වැදගත් මෙහෙයකි. එලෙස පළමුවන උපතිස්ස රජතුමා ජනතා සුභ සාධනය සඳහා සිදුකළ සුවිශේෂ කාර්යය කුමක් ද?
(1) රෝහල්වලට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම.
(2) උණ රෝගීන්ට ප්‍රතිකාර කිරීමට රෝහල් ඉදිකිරීම.
(3) ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා රෝහල් ඉදිකිරීම.
(4) විවිධ ප්‍රදේශවල රෝහල් පිහිටුවීමට දායක වීම.

14. අතීතයේ පුළුල් වූ ධර්ම කොටස් මතක තබාගත් භික්ෂූන් වහන්සේ හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) අන්තේවාසික (2) භාණකවරු (3) සද්විහරිය (4) ථෙර

15. වර්ෂා කාලයෙන් පසුව වැවේ එක්රැස්වන රොන්මඩ ඉවත් කිරීමට ඉවහල් කරගන්නා ලද වැවෙහි පිහිටි අංගය කුමක් ද?
(1) ගොඩ සොරොව්ව (2) මඩ සොරොව්ව (3) පිටවාන (4) ඇතුල්වාන

16. අතීත මිනිසා ගොවිතැන ඇසුරින් සකසාගත් අවකාශය මැනීම සඳහා භාවිතා කළ මිනුමක් වූයේ මේ අතරින් කුමක් ද?
(1) ආංගුලය (2) වියත (3) කරිසය (4) පරමාණුව

17. සෙල්ලිපිවල බොජකපති යනුවෙන් හඳුන්වා ඇති බදු වර්ගය කුමක් ද?
(1) ජලයෙන් අයකල බද්ද (2) මාළු ඇල්ලීම සම්බන්ධ බද්ද
(3) රජයේ ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් අයකළ බද්ද (4) ධාන්‍යය බද්ද

18. නිසිකාලයට සීසෑම නොකරන පුද්ගලයන්ට කලං පහක දඩයක් නියම කිරීම සම්බන්ධව නීතියක් සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
(1) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය (2) වේවැල්කැටිය ශිලා ලිපිය
(3) වෙස්සගිරි සෙල්ලිපිය (4) බදුලු ටැම් ලිපිය

19. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න,
- කාලිංග හා පාණ්ඩ්‍යය වංශිකයන් අතර බල අරගලය.
- දුර්වල පාලකයන් බලයට පත්වීම.

ඉහත ප්‍රකාශ අදාල වන්නේ කුමන රාජධානියක පරිහානිය සම්බන්ධයෙන් ද?
(1) අනුරාධපුරය (2) දඹදෙණිය (3) පොළොන්නරුව (4) යාපහුව

20. ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහතින් දක්වා ඇත.

A - චෙන් හෝ සෙන්පතිගේ පැමිණීම සිදුවීම.
B - බෙලිගල දළදා මාලිගයක් ඉදිකර දළදාව තැම්පත් කිරීම.
C - ඊජිප්තුව සමග තානාපති සබඳතා පැවැත්වීම.
D - කාලිංග මාඝ ආක්‍රමණය සිදුවීම.

මෙම ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ ඓතිහාසික අනුපිළිවල අනුව පෙළ ගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) ABCD (2) ABDC (3) DBCA (4) BACD

21. පහතින් සඳහන් වන්නේ උඩරට රාජධානියේ පාලකයන් කිහිපදෙනෙකු විසින් ඉටුකරන ලද කාර්යයන් කිහිපයකි. එහි I විමලධර්මසූරිය රජුට හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුට අයත් කාර්යභාර්යයන් අඩංගු පිළිතුර තෝරන්න.

A - 1638 ගන්නෝරුව සටනින් පෘතුගීසීන් පරාජය කිරීම.
B - දෙල්ගමු විහාරයේ තිබූ දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීම.
C - ලන්දේසීන් සමඟ සුහදව කටයුතු කිරීම.
D - වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.

(1) A හා B (2) B හා C (3) A හා C (4) B හා D

- **පහත වගුවේ සඳහන් වන්නේ විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත පිළිබඳ විස්තරයකි. ඒ ඇසුරු කරගෙන 22, 23 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| විද්‍යාඥයා | අයත් රට | සොයා ගැනීම |
|---|---|---|
| A. නිකලස් කොපර් නිකස් | E. ඉතාලිය | I. දුරදක්නය |
| B. අයිසෙක් නිව්ටන් | F. ජර්මනිය | J. ග්‍රහලෝක ඉලිප්සාකාර ගමන් මගක යාම |
| C. ගැලීලියෝ ගැලීලි | G. එංගලන්තය | K. පෘථිවිය ගෝලාකාර බව |
| D. ජොහැන්ස් කෙප්ලර් | H. පෝලන්තය | L. ගුරුත්වාකර්ෂණය |

22. ගුරුත්වාකර්ෂණ නියමය සම්බන්ධ නිවැරදි තේරීම වන්නේ කුමක් ද?
(1) AEJ (2) CEL (3) BFK (4) BGL

23. පෘථිවියේ ගෝලාකාර වීම සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) DFJ (2) AHK (3) BHK (4) DGJ

- **ශ්‍රී ලංකා සිතියම ඇසුරින් 24, 25 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




24. දොන් ජෙරනිමෝද අසවේදු හා I වන විමලධර්මසූරිය රජු හා සටන ඇතිවූ ස්ථානය දක්වන අක්ෂරය තෝරන්න.
(1) A (2) B
(3) C (4) D

25. ලන්දේසීන් විසින් පිහිටුවාගත් බලකොටුවක් වන ෆෙඩ්රික් කොටුවෙහි පිහිටීම දක්වනු ලබන අක්ෂරය කුමක් ද?
(1) F (2) G
(3) D (4) E

26. කාර්මික විප්ලවය සම්බන්ධ සොයාගැනීම් කීපයක් පහත දැක්වේ.

A - දුවන නඩාව නිපදවීම.
B - රෝලර් යන්ත්‍රය නිපදවීම.
C - ආරක්ෂක ලාම්පුව නිපදවීම.
D - දුම් බෝට්ටුව නිපදවීම.

ඉහත සොයාගැනීම් අතුරින් පේෂ කර්මාන්තයට හා ගල් අඟුරු කර්මාන්තයට අදාල තේරීම් යුගලය තෝරන්න.
(1) A හා B (2) B හා C (3) B හා D (4) A හා C

27. පින්තූරයේ දැක්වෙන උපකරණය කුමන ක්ෂේත්‍රයක් සම්බන්ධව නිපදවූ එකක් ද?



(1) ප්‍රවාහන
(2) සන්නිවේදන
(3) කෘෂිකර්මය
(4) කර්මාන්ත

28. කාර්මික විප්ලවය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් සහිත පිළිතුර කුමක් ද?
(1) නගර බිහිවීම (2) පරිසර දූෂණය
(3) අයිතිවාසිකම් සඳහා සටන් ආරම්භ වීම (4) වෙළෙඳ පන්තියේ වර්ධනයක් ඇතිවීම

29. අග්නිදිග ආසියාවේ පිහිටි ලන්දේසීන්ගේ අවධානයට ලක් වූ කුළුබඩු දිවයිනට අයත් දූපත කුමක් ද?
(1) සීෂෙල්ස් (2) මැඩගස්කරය (3) සුමාත්‍රා (4) ඇම්බොයිනා

30. උඩරටට දූත ගමන්වල යෙදුණු ජෝන් ෆයිබස් හා හියුබොයිඩ්ගේ දූත ගමන්වල ප්‍රධාන අරමුණ වූයේ කුමක් ද?
(1) වෙළෙඳ සම්බන්ධතා ඇතිකරගැනීම.
(2) ලන්දේසි බලකොටු යටත්කරගැනීමට උඩරට රජුගේ සහය ගැනීම
(3) සංස්කෘතික සබඳතා ඇතිකරගැනීම
(4) ත්‍රිකුණාමලය වරාය ලබාගැනීම

31. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A - පොල් ගසෙන් ලැබෙන ඵලදාව නොසලකා බදු අයකිරීම.
B - ඌව වෙල්ලස්සට මුස්ලිම් මුහන්දිරම් වරයෙකු පත්කිරීම.
C - බදු එකතු කිරීමට අවුමිල්දාර්වරුන් පත්කර ගැනීම.
D - 1840 මුඩුබිම් පනත නිසා වගාවට ඉඩම් නොලැබීම.

ඉහත ප්‍රකාශ වලින් 1797 විරෝධතා ව්‍යාපාරයට හේතු වූ කරුණු ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) B හා C (2) C හා D (3) A හා C (4) A හා D

32. පහත කරුණු හොඳින් අධ්‍යයනය කර පිළිතුරු සපයන්න.

A - ව්‍යවස්ථාදායක විධායක සභා පිහිටුවීම.
B - ප්‍රථම වතාවට සීමිත ඡන්ද බලය ලැබීම.
C - පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වාදීම.
D - විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදීම.

කෝල්බෘක් හා මැනිං ප්‍රතිසංස්කරණ වලට අදාල යුගලය වන්නේ මින් කුමක් ද?

(1) A හා B (2) B හා C (3) A හා C (4) C හා D

- **පහත ABCD වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර 33 - 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A සුරාබදු පනත
අමද්‍යප උද්ඝෝෂණ

B පොපිමල් ව්‍යාපාරය
සූරිය මල් ව්‍යාපාරය

C ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ආභාෂය
ලංකා ජාතික සංගමය බිහිවීම

D ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු ඝාතනය
පළමුවන ලෝක යුද්ධය

33. පළමුවැන්න නිසා දෙවැන්න ඉහළයාමට හේතුවන පද හෝ ප්‍රකාශ යුගලයට අයත් අක්ෂරය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

34. පළමු ප්‍රකාශය හා දෙවන ප්‍රකාශය කිසිසේත් නොගැලපෙන පද යුගලය වනුයේ,

(1) A (2) B (3) C (4) D

35. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න,

- පාර්ලිමේන්තුව කැඳවීම
- වාර අවසාන කිරීම
- මහා මැතිවරණයකින් පසු පැවැත්වෙන මංගල සභාවාර රැස්වීම්වල මුලසුන ගැනීම
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම

ඉහත දක්වා ඇත්තේ විධායක ජනාධිපතිතුමා සම්බන්ධ වූ කුමන බලතල ද,

(1) විධායක (2) ව්‍යවස්ථාදායක (3) අධිකරණ (4) රාජ්‍යය නායකයා සතු බලතල

36. මෙරට ආරම්භ කළ පළමු බහුකාර්යය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද?

(1) මහවැලි (2) ගල්ඔය (3) උඩවෙල (4) කොත්මලේ

37. පහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමුකරන්න.

- සීනි පනත • මුදල් නෝට්ටු පනත • මුද්දර පනත

මෙම පනත් පිළිබඳව සඳහන් වන සටන් ව්‍යාපාරය කුමක් ද?

(1) ඇමරිකන් නිදහස් සටන (2) ප්‍රංශ විප්ලවය
(3) රුසියන් විප්ලවය (4) ඉංග්‍රීසි නිදහස් සටන

- **පහත දැක්වෙන A හා B ප්‍රකාශ ඇසුරින් 38, 39 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. යටත් විජිත සඳහා වූ තරඟය B. ඉතාලියේ මුසෝලිනිගේ ක්‍රියාකලාපය

38. පළමු ලෝක යුද්ධය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?

(1) A හා B අසත්‍යය (2) A හා B සත්‍යය
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ

39. දෙවන ලෝක සංග්‍රාමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?

(1) අවි තරඟය හා ජාතිවාදය වර්ධනය වීම. (2) සරයේවෝ සිද්ධිය
(3) බිස්මාක්ගේ ක්‍රියාකලාපය (4) ජපානයේ ක්‍රියාකලාපය

40. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානය පිහිටි නගරය වන්නේ මින් කුමක් ද?

(1) වොෂින්ටන් (2) නිව්යෝර්ක් (3) බොස්ටන් (4) සැන්ප්‍රැන්සිස්කෝ

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - II** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) කදම්භ නදිය, වනවාහිනී නදිය, දඹකොළ පටුන, ගෝකණ්ණතිත්ථ, පතිරාජවෙල, ඉබ්බන්කටුව, පොළොන්නරුව, පඬුවස්නුවර, තිසාවැව, හුරුළුවැව, ගන්නෝරුව, මිණිපේ අමුණ (ල.12)

(ii) රෝමය, මලක්කා සමුද්‍ර සන්ධිය, අරාබි මුහුද, කල්කටාව, සුමාත්‍රා දූපත, පෘතුගාලය (ල.06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික සිදුවීම් වලට අදාල පිළිතුරු ලියන්න.

A ලංකාවේ විශාලතම පුවරු ලිපිය වන ගල්පොත සෙල් ලිපිය ලියවූ රජතුමා.

B රුවන්වැලිසෑය අකුණුසැරවලින් ආරක්ෂා කිරීමට එක්කළ උපාංගය

C කාර්මික විප්ලවය සමයේ බැටළු වර්ග අභිජනනය කිරීමෙන් සත්ව පාලනයේ වෙනසක් කළ තැනැත්තා

D නීතියේ සාරය නම් කෘතිය ලියා ප්‍රංශ විප්ලවයට දාර්ශනික මතවාදයක් එක්කළ දාර්ශනිකයා (ල.04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ලියන්න.

(ii) 1. මෙම පින්තූරයේ දැක්වෙන රජතුමා කවුද?

2. මෙතුමාගේ පාලන මධ්‍යස්ථානය කුමක් ද?

3. මෙම චිත්‍රය අඳින ලද්දේ කවුරුන් විසින් ද?

4. මෙතුමා විසින් ශ්‍රී ලංකාවෙන් පලවාහරින ලද විදේශීය ජාතිය නම් කරන්න (ල.04)

A



(iii) 1. මෙම පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2. එය කවුරුන් විසින් නිර්මාණය කරන ලද්දක් ද?

3. මෙය කුමන ක්ෂේත්‍රයක් සම්බන්ධව නිපදවන ලද්දක් ද?

4. මෙයින් පණිවිඩ යවන්නේ කුමන ආකාරයට ද? (ල.04)



B

---

## II - කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසස්ථාන පිහිටුවා ගැනීමේදී සැලකිලිමත් වූ කරුණු 03 ක් සඳහන් කරන්න. (ල.03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ පහතරට වියළි කලාපීය ලෙන් 02 ක් හා කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන 02 ක් ලියන්න. (ල.04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධි සඳහන් වන්නේ මිනී වැළලීම සම්බන්ධයෙනි. එලෙස මිනී වැළලීම සම්බන්ධයෙන් සාක්ෂි හමුවන ස්ථාන 02 ක් නම්කර එම ස්ථානවල මිනීවැළලීම සම්බන්ධයෙන් කළ චාරිත්‍ර විධි පිළිබඳ විස්තර කරන්න. (ල.05)

(iv) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වන්නේ කුමන කරුණු පදනම් කරගෙනදැයි යන්න කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

03 (i) මුල් ඓතිහාසික යුගයේ පැවති පහත ගම්මානවල විසූ වෘත්තිකයන් නම් කරන්න.

A - කසීකාරගාම

B - ගෝපාල ගාම

C - මණීකාරගාම (ල.03)

(ii) දේශපාලන බලය මධ්‍යගතවීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් කාර්යයන්ට සම්බන්ධ වූ රජවරුන් වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

A - තම දසවෙනි රාජ වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා ලකුණු කිරීම.

B - කතරගම හා චන්ද්‍රනගාමයේ ක්ෂත්‍රියන් ඒකරාශී කිරීම.

C - පරුමක තත්වයේ සිටි ප්‍රාදේශීය නායකයින්ට තනතුරු ලබාදීම.

D - පරිපාලන දිස්ත්‍රික් වෙන්කිරීම හා ඒවා පාලනයට ඇමතිවරු පත්කිරීම.

(මහසෙන්, වසභ, දේවානම්පියතිස්ස, දුටුගැමුණු, ධාතුසේන, පණ්ඩුකාභය) (ල.04)

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාර 02 ක් නම් කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.05)

(iv) I විජයබාහු රජතුමා තම පාලන මධ්‍යස්ථානය අනුරාධපුර සිට පොළොන්නරුවට මාරු කිරීමට බලපෑ හේතු සාධක 02 ක් නම් කර පැහැදිලි කරන්න. (ල.06)

04 (i) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ පාලන කටයුතුවලදී විවිධ පාලන ආයතන හැඳින්වීමට විවිධ නම් යොදා තිබිණි. එලෙස ක්‍රි.ව. 9 වන සියවසේ පහත සඳහන් ආයතන හැඳින්වීමට යොදා තිබූ නම් මොනවා ද?

A - ව්‍යවස්ථාදායක හා විධායක

B - අධිකරණය

C - ප්‍රාදේශීය පරිපාලන මණ්ඩල (ල.03)

(ii) අප රට පාලනය කළ බුද්ධිමත් රජවරු අතීතයේ දී අසල්වැසි රටවල් සමග සුහදශීලී සම්බන්ධතා පවත්වා ගත්හ. එලෙස පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ සබඳතා පැවැත්වූ රජවරුන් කවුරුන්දැයි නම් කරන්න.

A - පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට යාම.

B - චීනයට විසිවතාවක් රාජ්‍යතාන්ත්‍රික දූත ගමන් යෙදීම.

C - රෝමයෙන් වීදුරු පබළු ගෙන්වා රුවන්වැලිසෑය අලංකාර කරවීම.

D - තම සොයුරිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහ කරදීම. (ල.04)

(iii) පුරාණ වාරි ශිල්පීන් විශාල වැව් ඉදිකිරීමේදී වැව් බැම්ම ගිලානොබැසීමටත් එහි ස්ථායීතාවය ආරක්ෂා කිරීමටත් යෙදූ ක්‍රම ශිල්ප උදාහරණ 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

(iv) අපේ පැරැන්නන් නගර නිර්මාණයේ දී අපද්‍රව්‍ය කලමණාකරණය පිළිබඳ අවබෝධයෙන් ක්‍රියාකළ ආකාරය උදාහරණ 02 ක් සහිතව පැහැදිලි කරන්න. (ල.06)

05 (i) පළමු නාගරීකරණය අවසානයත් දෙවන නාගරීකරණය ආරම්භයත් අතර කාලයේ ස්වදේශික නායකයන් ප්‍රාදේශීය රාජධානි පිහිටුවා ගෙන ශාසනය හා රට සුරක්ෂිත කරගත් බව මහා වංශයේ දක්වේ. එලෙස පිහිටුවාගත් රාජධානි 03 ක් ABC ලෙස දක්වා ඇත. ඒවායේ පාලනය කළ ප්‍රාදේශීය පාලකයන් කවුරුන්දැයි ABC අනුපිළිවෙළින් නම් කරන්න.

A - යාපහුව

B - ගෝවින්දමලය

C - ගංදෙණි පර්වතය (ල.03)

(ii) පහත A, B, C, D වල සඳහන් සිදුවීම් සිදුවූයේ කුමන රජවරුන්ගේ කාලයේදැයි වරහන තුළින් තෝරා පිළිවෙළින් ලියා දක්වන්න.

A - චන්ද්‍රභානු නම් ජාවක රජුගේ ආක්‍රමණ සිදුවීම.

B - කාලිංගරායර් හා චෝඩගංගදේවගේ ආක්‍රමණය සිදුවීම.

C - සපුමල්කුමරු යාපනය ජය ගැනීම.

D - සිංහල සංගය නම් කැරැල්ලක් ඇතිවීම. (ල.04)

(II පරාක්‍රමබාහු / VI බුවනෙකබාහු / VI පරාක්‍රමබාහු / I විජයබාහු / I බුවනෙකබාහු / VII බුවනෙකබාහු)

(iii) දෙවන නාගරීකරණය අවධියේ ගෘහනිර්මාණ ශිල්පයේ ඇතිවූ දියුණුව යාපහුව හා ගම්පොල රාජධානියේ නිර්මාණ ඇසුරින් විමසන්න. (ල.05)

(iv) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය ලෙස හැඳින්වීමට බලපෑ හේතු 3 ක් දක්වා විස්තර කරන්න. (ල.06)

06 (i) පහත සඳහන් නම්වලින් බෞතීස්ම ලැබූ ප්‍රභුවරුන් කවුරුන්දැයි A B C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - දොන් පිලිප් B - දොන් ජුවන් C - දෝන කතිරිනා (ල.03)

(ii) පහත සඳහන් වන්නේ උඩරට රාජධානියේ බද්දේ සංවිධානයට අයත් සංවිධාන ව්‍යුහයයි. එම සංවිධාන ව්‍යුහයන් අයත්වූයේ කුමන කාර්යයන් සම්බන්ධයෙන්දැයි වරහන තුළින් තෝරා පිළිවෙලින් ලියන්න.

A - මඩිහෙ බද්ද B - කුරුවේ බද්ද C - බඩහැල බද්ද D - හැඳ බද්ද (ල.04)

(ආභරණ තැනීම / ප්‍රවාහන කටයුතු / රෙදි විවීම / කුරුදු තැලීම / වළං තැනීම / ඇතුන් ඇල්ලීම)

(iii) පෘතුගීසීන් උඩරට රාජධානිය තුළ තම බලය පැතිරවීම සඳහා උත්සාහ ගත් උත්සාහයන් 02 ක් සඳහන් කර ඒ පිළිබඳව විස්තර කරන්න. (ල.05)

(iv) දෙවන රාජසිංහ රජු ලන්දේසීන් මෙරටට කැඳවාගැනීමේ අරමුණු 02 ක් සඳහන් කර ඒ පිළිබඳව පැහැදිලි කරන්න. (ල.06)

07 (i) ප්‍රංශ ජාතිකයින් ඉන්දියාවට පැමිණ එහි වෙළඳ මධ්‍යස්ථාන පිහිට වූ ස්ථාන 03 ක් නම් කරන්න. (ල.03)

(ii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය සම්බන්ධව වෙළඳ සමාගමට විරුද්ධව ඇතිවූ කැරැල්ල පිළිබඳව සොයා බැලීමට පත්කළ කොමිසමේ නිර්දේශයන් 04 ක් නම් කරන්න. (ල.04)

(iii) 1803 උඩරට ආක්‍රමණය අසාර්ථකවීමට බලපෑ කරුණු 03 ක් දක්වා පැහැදිලි කරන්න. (ල.05)

(iv) 1848 නිදහස් අරගලය ඇතිවීමට බලපෑ හේතු 03 ක් දක්වා පැහැදිලි කරන්න. (ල.06)

---

## III - කොටස

(08) (i) යුරෝපා සාහිත්‍යයේ ඇති වූ නව ප්‍රබෝධය නිසා පහත සඳහන් රටවලින් බිහිවූ ගත්කතුවරයා බැගින් නම් කරන්න.

A - ඉතාලිය

B - එංගලන්තය

C - ප්‍රංශය (ල.03)

(ii) පහත සඳහන් වන්නේ යුරෝපයේ දේශ ගවේෂණ වලින් සොයාගත් විවිධ ප්‍රදේශ කිහිපයකි. එම ප්‍රදේශ සොයාගත් දේශ ගවේෂකයින් ABCD අනුපිළිවෙළින් නම් කරන්න.

A - කුණාටුතුඩුව

B - බටහිර ඉන්දීය දූපත්

C - පිලිපීනය

D - කැනඩාව (ල.04)

(iii) යුරෝපයේ ඇති වූ පුනරුදය ගෝලීය ප්‍රවණතාවයක් බවට පත්වූයේ කෙසේදැයි කරුණු 03 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

(iv) යුරෝපයේ ඇතිවූ පුනරුදයේ බලපෑම ශ්‍රී ලාංකික සමාජයේ පුළුල් වෙනසක් ඇතිකිරීමට හේතු විය. මෙය ක්ෂේත්‍ර 3 ක් ඔස්සේ උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල.06)

09 (i) ප්‍රංශ විප්ලවය දිරිමත් කිරීමට හේතු වූ දාර්ශනික මතවාද ඉදිරිපත් කළ දාර්ශනිකයෝ තිදෙනෙකු නම් කරන්න. (ල.03)

(ii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ දේශපාලන හේතු 04 ක් ලියන්න. (ල.04)

(iii) පළමු ලෝක සංග්‍රාමය ආරම්භවීමට බලපෑ හේතු 02 ක් දක්වා පැහැදිලි කරන්න. (ල.05)

(iv) එක්සත් ජාතීන්ගේ සංගමය ලෝක සාමය සුරක්ෂිත කිරීම සඳහා ගත් පියවර 03 ක් දක්වා විස්තර කරන්න. (ල.06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -( 3 ) | 2 -( 2 ) | 3 -( 1 ) | 4 -( 4 ) | 5 -( 2 ) | 6 -( 1 ) | 7 -( 3 ) | 8 -( 2 ) | 9 -( 2 ) | 10 -( 3 ) |
| 11-( 1 ) | 12 -( 3 ) | 13 -( 3 ) | 14 -( 2 ) | 15 -( 2 ) | 16 -( 3 ) | 17 -( 3 ) | 18 -( 1 ) | 19 -( 3 ) | 20 -( 3 ) |
| 21-( 4 ) | 22 -( 4 ) | 23 -( 2 ) | 24 -( 2 ) | 25 -( 4 ) | 26 -( 4 ) | 27 -( 1 ) | 28 -( 3 ) | 29 -( 4 ) | 30 -( 1 ) |
| 31-( 3 ) | 32 -( 3 ) | 33 -( 1 ) | 34 -( 4 ) | 35 -( 2 ) | 36 -( 2 ) | 37 -( 1 ) | 38 -( 3 ) | 39 -( 4 ) | 40 -( 2 ) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i)




(ii)



## I - කොටස

(01) (ආ) (i) A නිශ්ශංකමල්ල B වජ්ජුම්බටය
C රොබට් බැක් වේල් D මොන්ටෙක්ස්ක්‍යු (ල.04)

(ii) 1. දෙවන රාජසිංහ 2. මහනුවර
3. රොබට් නොක්ස් 4. පෘතුගීසි (ල.04)

(iii) 1. ගුවන් විදුලි යන්ත්‍රය 2. ගුග්ලිමෝ මාර්කොනි
3. සන්නිවේදන 4. ගුවන්විදුලි තරංග මඟින් (ල.04)

## II - කොටස

(02) (i)
- ආහාර සඳහා අවශ්‍ය ස්වභාවික සම්පත් බහුල ප්‍රදේශ
- ජල පහසුකම් ලබාගත හැකි ප්‍රදේශ
- ගල් මෙවලම් සාදාගැනීමට අවශ්‍ය පාෂාණ බහුල ප්‍රදේශ

(ii)
- පහත රට වියළි කලාපීය ජනාවාස :- සීගිරිය, පොතාන, අලිගල
- කඳුකර දඬයම් :- බණ්ඩාරවෙල, හෝර්ටන් තැන්න

(iii)
- බදුල්ලට නුදුරු රාවණා ඇල්ල - හිස්කබල ගලක උලා ඔපමට්ටම්කර ගුරුගල් ආලේප කිරීම
- පාහියන්ගල ගල් ගුහාව - මළ සිරුරෙහි කොටස් දිරායනතුරු වලලා තබා පසුව ඇටකටු ගොඩටගෙන ඒවා වෙනම තැම්පත් කිරීම.
- කුරුවිට බටදොඹලෙන - ඇටසැකිලි නවා වකුටුකර වල දැමීම

(iv)
- පිළිස්සූ මැටි වලං භාවිතය ආරම්භ කිරීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම
- යකඩ ලෝහය භාවිතය ආරම්භය (එක් කරුණකට 02 බැගින් හා පැහැදිලි කිරීමට 04 ක්)

03 (i) A - ගොවියන් B - ගොපල්ලන්
C - මැණික් කර්මාන්තයේ යෙදුණු අය (මැණික් කපන්නන්, මැණික් ගරන්නන්)

(ii) A - පණ්ඩුකාභය රජතුමා B - දේවානම්පියතිස්ස රජු
C - දුටුගැමුණු රජු D - වසභ රජු

(iii)
- සහෝදරයාගෙන් සහෝදරයාට - දේවානම්පියතිස්ස රජුගෙන් පසු ඔහුගේ සොහොයුරන් රජවීම.
- පියාගෙන් පුතාට - කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජුට, වසභගෙන් පසු වංකනාසිකතිස්ස රජුට

(iv)
- ඉන්දියානු සාගරයේ බටහිර ප්‍රදේශ මූලික කරගෙන පැවති අන්තර්ජාතික වෙළඳාම නැගෙනහිර ඉන්දියානු සාගරයේ නැගෙනහිර කොටසට මාරුවීම නිසා
- ත්‍රිකුණාමලයේ වෙළෙඳ කටයුතු පාලනය කිරීම පොළොන්නරුවේ සිට පහසුවීම (පිටු අංක 42)

04 (i) A - එක්තැන්සමිය B - සභාව C - දසගම් ඇත්තන්

(ii) A - ගජබා රජු B - VI වන අග්ගබෝධි C - භාතිකාභය D - I වන විජයබාහු

(iii)
- ගිලා බැසීම වැලැක්වීමට - පොළවේ යම් තැනක පිහිටි ගලක් තෝරාගෙන ඒ මත ඉදි කරන වැව් බැම්ම දෙපසින් කඳුවලට යා කිරීම. (උදා.- යෝධ වැවේ වැව් බැම්ම)
- ස්ථායිතාවය - පස්තට්ටු කිහිපයක් එකිනෙක මත අතුරා තදින් තලා වැව් බැම්ම ඉදිකිරීම (පිටු අංක 66)

(iv)
- කැසිකිලි වැසිකිලිවල අපද්‍රව්‍ය පරිසරය ආරක්ෂා වන පරිදි රැගෙන යාම.
- නගරයේ කාණු පද්ධති ඉදිකර අපවිත්‍ර ජලය ගලා යෑමට සැලැස්වීම.
- නාන පොකුණුවල අපද්‍රව්‍ය විශේෂ නල හරහා රැගෙන යාම.

05 (i) A - සුභ සෙන්පති B - බුවනෙක බා ආදිපාද C - සංඛ සෙනවි

(ii) A - II පැරකුම් B - I බුවනෙකබාහු C - VI පැරකුම් D - VI බුවනෙකබාහු

(iii)
- යාපහුව :- යාපහුවේ පියගැට පෙළ හා එහි කුළුණු නිර්මාණය (පාණ්ඩ්‍යය හා කාම්බෝජය ආභාෂය ලබා තිබීම)
- ගම්පොළ :- ගඩලාදෙණි විහාරයේ ඇති පිළිම ගෙය (දකුණු ඉන්දියානු ආභාෂය ලබා තිබීම), පිළිමගෙවල් වලට සම්බන්ධකොට දේවාල ඉදිකර තිබීම. (උදා.- ලංකාතිලක පිළිමගෙය), තුන්වන වික්‍රමබාහු කළ ඇම්බැක්කේ දේවාලය

(iv)
- උගත් පඬිවරු බිහිවීම - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, කැරගල වනරතන හිමි, ඉරුගල්කුලතිලක පිරිවෙන් හිමි ආදිය සාහිත්‍යයේ දියුණුවට වැඩ කිරීම.
- සාහිත්‍ය කෘති රචනා කිරීම - පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, සන්දේශ කාව්‍ය, භක්ති කාව්‍යය, ප්‍රශස්ති කාව්‍ය ආදී පොත් බිහිවීම
- පිරිවෙන් බිහිවීම - පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන (105 පිටුව)

06 (i) A - යමසිංහ බණ්ඩාර B - කොනප්පු බණ්ඩාර C - කුසුමාසන දේවිය

(ii) A - ප්‍රවාහන කටයුතු B - ඇතුල් ඇල්ලීම C - වළං තැනීම D - රෙදි විවීම

(iii)
- 1594 ජනරාල් පේරෝ ලෝපේස් ද සුසා දියත් කළ ආක්‍රමණය
- දොන් ජෙරනිමෝද අසවේදු උඩරට ආක්‍රමණය කළ අවස්ථාව (පිටු - 132, 133)

(iv)
- පෘතුගීසීන් එලවා දැමීම
- පෘතුගීසීන් සතු ප්‍රදේශ තමන් යටතට ගෙන ස්වාධීන නිදහස් ලංකාවක් බිහිකිරීම (පිටු 135)

07 (i)
- පොන්ඩිචෙරි
- කාරිකාල්
- චන්ද්‍රනගර්

(ii)
- මදුරාසි නිලධාරීන් ආපසුයවා දේශීය නිලධාරීන් බදු එකතු කිරීමට යෙදවීම
- පොල්ගස් බද්ධ ඇතුළු බදු වර්ග ඉවත් කිරීම
- ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙනම නිලධාරීන් පත්කිරීම
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම

(iii)
- වැසි සමය ආරම්භ වීම
- ඉංග්‍රීසි හමුදාව අතර ලෙඩරෝග පැතිරීයාම
- පහතරට සිට උඩරටට තිබූ සැපයුම් මාර්ග අවහිර වීම
- කොළඹ සමග පණිවිඩ හුවමාරුව දුර්වල වීම

(iv)
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල බලපෑම - රජයේ ඉඩම් ප්‍රතිපත්තිය, ගම්සභා අඩපණ වීම
- නව අධිකරණ ක්‍රමය
- රජය හා මහජනතාව අතර සබඳතාව දුරස්වීම
- රජයේ නව බදු ප්‍රතිපත්තිය (පිටුව 40 - 11 ශ්‍රේණිය)

## III - කොටස

(08) (i) A - ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ B - තෝමස් මුවර්, ෆැන්සිස් බේකන්, විලියම් ෂේක්ස්පියර්
C - ඉරාස්මස්

(ii) A - බර්තලමියු ඩයස් B - ක්‍රිස්ටෝෆර් කොලොම්බස්
C - ෆර්ඩිනන්ඩ් මැගලන් D - කැබේ සහෝදරයෝ

(iii)
- යුරෝපා චින්තනය හා සාහිත්‍යය වෙනත් රටවලට ව්‍යාප්ත වීම
- යටත්විජිතවල ධනවතුන්ගේ දූ දරුවන් අධ්‍යාපන කටයුතු සඳහා යුරෝපය යාම
- යුරෝපීයන් තමරටවල ආගම් දේවස්ථාන හා ගොඩනැගිලි යටත් විජිතවල නිර්මාණය කිරීම
- යුරෝපීය තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම යටත් විජිතවලට ලබාදීම

(iv)
- දේශපාලන බලපෑම් :- රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලැබීම, එම ක්‍රමයට ගැලපෙන ආයතන හා නිලධාරී පැලැන්තියක් බිහිවීම
- සමාජයීය බලපෑම :- විවිධ ආගමික නිකායන් ලංකාවට පැමිණීම, ලාංකිකයන් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනය ලබා පැමිණීම නිසා බටහිර චින්තනය මෙරටට ලැබීම
- ආර්ථික පලපෑම :- ලංකාව හා යුරෝපය අතර සෘජු වෙළඳ සබඳතා ඇතිවීම, මෙරට වාණිජ ආර්ථික රටාවකට හුරුවීම, ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය බිඳවැටීම, ආනයන අපනයන ආර්ථිකයක් ඇතිවීම, මුදල් භාවිතය ප්‍රචලිත වීම, මහාමාර්ග හා දුම්රියමාර්ග පද්ධතියක් බිහිවීම, සමාජයේ මධ්‍යම පන්තියක් බිහිවීම

09 (i)
- මොන්ටෙක්ස්‍යු
- වෝල්ටෙයාර්
- රූසෝ

(ii)
- රජුවටා ව්‍යවස්ථාදායක විධායක අධිකරණ බලතල ඒකරාශීවීම
- රජුගත කළ සුඛෝපභෝගී ජීවිතය
- රජු හා සාමාන්‍යය ජනතාව අතර සබඳතාවය දුරස්වීම
- රඳලයින් අතර පැවති ප්‍රාදේශීය පාලනය අකාර්‍යක්ෂමවීම (පිටු අංක - 118, 120 - 11 ශ්‍රේණිය)

(iii)
- ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත්වීම.
- ජර්මන් අධිරාජ්‍යය වූ දෙවන විලියම්ගේ ක්‍රියාකලාපය
- යටත්විජිත සඳහා වූ තරගය
- අවිතරගය හා ජාතිවාදය
- බිස්මාක්ගේ විදේශ ප්‍රතිපත්තිය
- ඔස්ට්‍රියාවේ ඔටුන්නහිමි කුමරු ඝාතනය කිරීම (පිටු අංක 133, 134 - 11 ශ්‍රේණිය)

(iv)
- සූවස් අර්බුදය සමථයකට පත්කිරීම
- ගල්ෆ් අර්බුදය විසඳීම
- කියුබානු මිසයිල අර්බුදය විසඳීම (පිටු අංක 158 - 11 ශ්‍රේණිය)